# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 03 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 නොවැම්බර් මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැක.

මිල : ශත 90 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1981 නොවැම්බර් මස 03 වන දින]

එල්. ඩී.—ඕ. 33/79.

**ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පිහිටුවීම සඳහා ද, කඳවල වත්ත හා එහි ඇති චංචල දේපළ අභ්‍යාස ආයතනය සතු කිරීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලසීම පිණිස වූ පනතකි.**

සී.එච්., කේ.බී.ඊ. නාමධාරී, නීති ආචාර්ය ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවලට අයත් වූ සහ ඔහු සන්තකයෙහි පැවති සහ මෙහි වූ උපලේඛනයෙහි විස්තර කොට තිබෙන, කඳවල වත්ත නමින් හඳුන්වනු ලබන ඉඩම හා එහි නිවාස ස්ථානය, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ශ්‍රී රගවාන් නාරායනසාමි විසින් සහතික කරන ලද වර්ෂ 1979 ජූලි මස 11 වන දින අංක 1292 දරන ඔප්පුව මගින් එකී ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවල විසින් පරම හා අවලංගු කළ නොහැකි ත්‍යාගයක් ලෙස හා ත්‍යාගයක ආකාරයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පවරනු ලැබූ හෙයින් ද :

එහි වූ උපලේඛනයෙහි විස්තර කොට තිබෙන සියලුම චංචල දේපළ, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, ශ්‍රී රගවාන් නාරායනසාමි විසින් සහතික කරන ලද වර්ෂ 1980 අප්‍රේල් මස 7 වන දින අංක 1389 දරන ඔප්පුව මගින් එකී සී.එච්., කේ.බී.ඊ. නාමධාරී, නීති ආචාර්ය ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවල විසින් පරම හා අවලංගු කළ නොහැකි ත්‍යාගයක් ලෙස හා ත්‍යාගයක ආකාරයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පවරනු ලැබූ හෙයින් ද :

තවද, කැඩෙට් නිලධාරී පෙර පුහුණුව ලබාදීම පිණිස ජාතික රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනයක් පිහිටුවීමේ කාර්ය සඳහා එකී ඉඩම සහ නිවාස ස්ථානය සහ චංචල දේපළ භාවිතා කරනු ලැබීම අභාවප්‍රාප්ත සී. එච්., කේ. බී. ඊ. නාමධාරී, නීති ආචාර්ය ශ්‍රීමත් ජෝන් ලයනල් කොතලාවලගේ අපේක්ෂාව සහ අභිලාෂය වූ හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය. **ලුහුඬු නාමය.**

## I වන කොටස

### ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය

2. (1) (මෙහි මින් මතු "අභ්‍යාස ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය යනුවෙන් හැඳින්විය යුතු අභ්‍යාස ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය. **ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය පිහිටුවීම.**

1—ඒ 58282–14,500 (81/09)

(2) අභ්‍යාස ආයතනය (1) වන උපවගන්තියෙන් එයට දෙන ලද නාමයෙන් යුක්ත වූ, සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය ; තවද ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම සහ එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ හැකි ය.

අභ්‍යාස ආයතනයේ පරමාර්ථ.

3. අභ්‍යාස ආයතනයේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) පෙර පුහුණු කැඩෙට් නිලධාරි අභ්‍යාසයන් සඳහා අදාළ වන යම් විෂයයන් පිළිබඳ ශාස්ත්‍රීය අධ්‍යයන කටයුතු සඳහා පහසුකම් සැපයීම සහ ඒ අධ්‍යයන කටයුතුවල දී උපදෙස් දීම ;

(ආ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන්ට මූලික සේවා අභ්‍යාසයක් ලබා දීම ;

(ඇ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන්ගේ චරිතය, ආත්ම විශ්වාසය සහ නායකත්වයට ඔබින ගුණාංග වර්ධනය කිරීමේ කාර්ය සඳහා, ඔවුන් අතර සහෝදරත්වය පිළිබඳ හැඟීමක් හා සුහදතාව නංවාලීම සහ ඔවුන් අතර අවබෝධය වර්ධනය කිරීම ; සහ

(ඈ) අභ්‍යාස ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය යයි අභ්‍යාස ආයතනය විසින් සලකනු ලබන වෙනත් යම් කර්තව්‍යයන් කිරීම.

අභ්‍යාස ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය.

4. අභ්‍යාස ආයතනයේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, එය විසින්, පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ කිරීම කළ හැකි ය :—

(අ) දේශීය හෝ විදේශීය ප්‍රභවවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) මේ පනත මගින් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නියෝදනයක් ප්‍රකාරව නැතහොත් අන්‍යාකාරයකින් අභ්‍යාස ආයතනය වෙත පවරනු ලැබෙන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හෝ අයිතිව සිටීම සහ එකී යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, හිමිකර දීම, අන්තිම කැමති පත්‍රයකින් හිමිකර දීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් නියෝදනය කිරීම ;

(ඇ) අභ්‍යාස ආයතනයේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට හෝ එකඟවීම්වලට, කෙළින්ම හෝ අභ්‍යාස ආයතනය විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයකු මගින් හෝ නියෝජිතයකු මගින් එළඹීම සහ ඒ ගිවිසුම් හා එකඟවීම් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීම ;

(ඈ) අභ්‍යාස ආයතනයේ කාර්ය සඳහා, කළමනාකාර මණ්ඩලය විසින් සුදුසු යයි අදහස් කරනු ලබන ආකාරයකින් සහ එසේ අදහස් කරනු ලබන ඇප මත, මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඉ) අභ්‍යාස ආයතනයේ කර්තව්‍ය කරගෙන යාම සඳහා අවශ්‍ය සේවා නියුක්තයන් හා නියෝජිතයන් පත් කිරීම ;

(ඊ) කළමනාකාර මණ්ඩලය විසින් සුදුසු යයි අදහස් කරනු ලබන ආකාරයකින් අභ්‍යාස ආයතනයේ අරමුදල් ආයෝජනය කිරීම ; සහ

(උ) අභ්‍යාස ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වන්නා වූ, හිතකර වන්නා වූ, හෝ ආනුෂංගික වන්නා වූ සියලු ක්‍රියා කිරීම.

අභ්‍යාස ආයතනයේ කළමනාකාර මණ්ඩලයෙහි සංයුතිය.

5. අභ්‍යාස ආයතනයේ කටයුතු පිළිබඳ කළමනාකරණය හා පරිපාලනය ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකාර මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය :—

(අ) රාජ්‍ය ආරක්ෂක කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ; ඔහු මණ්ඩලයේ සභාපතිවරයා වන්නේ ය ;

(ආ) ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදාවල අණ දෙන නිලධරයන් ;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, මහා භාණ්ඩාගාරයේ නිලධරයකු ;

(ඈ) අභ්‍යාස ආයතනයේ සේනාවිධායක තනතුර තත්කාලයෙහි දරමින් සිටින තැනැත්තා ; සහ

(ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු.

සේනාවිධායක.

6. (1) ජනාධිපතිවරයා විසින් (මෙහි මින් මතු "සේනාවිධායක" යනුවෙන් සඳහන් කරනු ලබන) අභ්‍යාස ආයතනයේ සේනාවිධායක ලෙස සන්නද්ධ සේවාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කළ යුතු අතර, ඔහු ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය ; තව ද මරණය සිදු වීම නිසා හෝ ඉල්ලා අස්වීම නිසා හෝ ඉවත් කරනු ලැබීම නිසා හෝ ඔහු තම ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු විසින් තුන් අවුරුදු කාල සීමාවක් තම ධුරය දැරිය යුතු ය.

(2) අභ්‍යාස ආයතනය පිහිටුවීමේ දිනයේ දී සේනාවිධායක වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඒ සේනාවිධායකගේ ධුර කාලය අවසන් වූ පසු සේනාවිධායක වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු පත් කරනු ලැබිය යුතු ය ; දෙවනුව සඳහන් සේනාවිධායකගේ ධුර කාලය අවසන් වූ පසු පත් කළ යුතු සේනාවිධායක ශ්‍රී ලංකා ගුවන්

හමුදාවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු විය යුතු ය; තවද, සේනාවිධායක තනතුරට ඉන් පසුව කරනු ලබන පත් කිරීම් මෙහි සඳහන් පිළිවෙළ අනුව කළ යුතු ය.

(3) ජනාධිපතිවරයා වෙත අමතනු ලබන ලිඛිත දැනුම් දීමක් මගින්, සේනාවිධායක විසින් සිය සේනාවිධායක ධුරයෙන් ඉල්ලා අස් විය හැකි ය.

(4) සේනාවිධායක ධුරයෙන් ඉවත් කිරීම අවස්ථානුකූල යයි ජනාධිපතිවරයා අදහස් කරන්නේ නම්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ජනාධිපතිවරයා විසින් ඊට හේතුවක් නො දක්වා සේනාවිධායක ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(5) යම් සේනාවිධායකයකු සම්බන්ධයෙන් (4) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ විට, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින හෝ ඒ නියමයෙහි නිශ්චිත වශයෙන් සඳහන් වන වෙනත් යම් දිනයක, ඒ සේනාවිධායක විසින් තම ධුරය හිස් කළ යුතු ය.

(6) (1) වන උපවගන්තිය යටතේ යම් සන්නද්ධ සේවාවකින් පත් කරන ලද—

(අ) සේනාවිධායක, සේනාවිධායක වශයෙන් තම ධුර කාලය අව සන් වීමට පෙර තම ධුරය අත් හළ හෝ, තමා අනුයුක්ත සන්නද්ධ සේවාවේ සාමාජිකයකුව සිටීම අවසන් කළ අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් ඒ සන්නද්ධ සේවාවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු සේනාවිධායක වශයෙන් පත් කළ යුතු අතර, ඔහු කලින් ධුරය අත් හළහොත් මිස, ඔහුගේ පූර්වගාමී සේනාවිධායකගේ ධුර කාලයේ නොගෙවී ශේෂව ඇති කාල සීමාව තුළ ඔහු විසින් ධුරය දැරිය යුතු ය; නැතහොත්

(ආ) සේනාවිධායකට, රෝගාතුරවීම නිසා, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා, තම ධුරයේ කර්තව්‍ය කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට සේනාවිධායක ලෙස ක්‍රියා කිරීම සඳහා ඒ සන්නද්ධ සේවාවේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු ජනාධිපතිවරයා විසින් පත් කළ යුතු ය.

(7) මේ වගන්තියේ කාර්ය සඳහා "සන්නද්ධ සේවාවන්හි ජ්‍යෙෂ්ඨ නිලධරයා" යන යෙදුමෙන්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව සම්බන්ධයෙන් වන විට, කර්නල් වරයකුගේ තරාතිරමට පහළ නොවූ නිලයක් දරන නිලධර යෙක්;

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව සම්බන්ධයෙන් වන විට, කපිතාන් වරයකුගේ තරාතිරමට පහළ නොවූ නිලයක් දරන නිලධර යෙක්; සහ

(ඈ) ශ්‍රී ලංකා ගුවන් හමුදුව සම්බන්ධයෙන් වන විට, රාශි කපිතාන් වරයකුගේ තරාතිරමට පහළ නොවූ නිලයක් දරන නිලධරයෙක්

අදහස් වේ.

7. (1) අභ්‍යාස ආයතනයේ කටයුතු මෙහෙයවීම, එහි බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ එහි සේවානියුක්තයන් හා පෙර පුහුණු කැඩෙට් නිලධරයන් පිළිබඳ පරිපාලනමය පාලනය, මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට හා පාලනයට යටත්ව, සේනාවිධායක වෙත භාර කරනු ලැබිය යුතු ය. සේනාවිධායකගේ කාර්ය.

(2) සේනාවිධායක විසින් තම බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරින් පැවරීමට අවශ්‍ය යයි කලින් කල සලකනු ලබන බලතල, කාර්ය සහ කර්තව්‍ය, මණ්ඩලයේ අනුමතය ඇතිව, අභ්‍යාස ආයතනයේ යම් සේවා නියුක්තයකු වෙත ලියවිල්ලකින් පවරනු ලැබිය හැකි අතර, එසේ ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය පවරන ලද යම් සේවා නියුක්තයකු විසින්, සේනාවිධායකගේ සාමාන්‍ය හෝ විශේෂ විධාන වලට යටත්ව, ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කළ යුතු ය.

8. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. අභ්‍යාස ආයතනයේ අරමුදල.

(2) ඒ අරමුදල කළමනාකරණය කිරීමේ, පාලනය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

9. පහත දැක්වෙන මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය :— අරමුදලට කරනු ලබන ගෙවීම්.

(අ) අභ්‍යාස ආයතනයේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලුම මුදල් ;

(ආ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් බාහිර, කවර හෝ ප්‍රභවයකින්, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අභ්‍යාස ආයතනයට ලැබෙන සියලුම මුදල් ;

(ඇ) අභ්‍යාස ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී, සහ කිරීමේ දී එයට ලැබෙන සියලු මුදල්.

10. පහත දැක්වෙන මුදල් අරමුදලෙන් ගෙවනු ලැබිය යුතු ය :— අරමුදලෙන් කරනු ලබන ගෙවීම්.

(අ) අභ්‍යාස ආයතනය පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වියදම් ;

(ආ) නිලධරයන්ගේ, සේවකයන්ගේ හා වෙනත් සේවානියුක්තයන්ගේ වැටුප් ගෙවීම ;

(ඇ) අභ්‍යාස ආයතනයේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය බවට මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලුම ගෙවීම්.

මණ්ඩලයේ රැස්වීම.

**11.** මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින් මණ්ඩලයේ රැස්වීම් පිළිබඳ කාර්ය පරිපාටිය සහ ඒ රැස්වීම් වල කටයුතු විධිමත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම හේතුකොටගෙන මණ්ඩලයේ කටයුතු නිර්බල නොවිය යුතු බව.

**12.** මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් තිබීම පමණක් හෝ එහි සාමාජිකයන් පත්කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීම පමණක් හෝ හේතුකොටගෙන මණ්ඩලයේ කිසිම ක්‍රියාවක්, තීරණයක් හෝ කටයුත්තක් නිර්බල නොවිය යුතු ය.

අභ්‍යාස ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

**13.** (1) අභ්‍යාස ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන් හා සේවකයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට, නියම කරනු ලබන ආකාරයකින් හා අනුප්‍රමාණයන් අනුව, පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, නියම කරනු ලබන සේවා කොන්දේසිවලට සහ විනය පාලනයට ද ඔවුන් යටත් විය යුතු ය.

(3) රජයේ යම් නිලධරයකු, මණ්ඩලයේ ඉල්ලීම පිට, ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව සහ මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා, අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(4) රජයේ යම් නිලධරයකු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) රජයේ යම් නිලධරයකු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ, 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලසීමාවක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කර ගනු ලැබූ අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අභ්‍යාස ආයතනයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ එකඟවීමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා, ආණ්ඩුවට කරන ලද සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලයේ හෝ ඒ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, සහ විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් පිළිබඳ නියමයන් හා කොන්දේසි ද ඇතුළුව, මණ්ඩලය සහ පළාත් පාලන සේවා උපදේශක මණ්ඩලය හෝ ඒ පළාත් පාලන ආයතනය එකඟ වන නියම හා කොන්දේසි පිට, මණ්ඩලය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවකට අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කිරීම හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කිරීම හෝ කරනු ලැබිය හැකි ය.

(8) (7) වන උපවගන්තිය ප්‍රකාර යම් තැනැත්තකු අභ්‍යාස ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ සෙසු සාමාජිකයන් යටත් වන විනය පාලනයට ම ඒ තැනැත්තා ද යටත් විය යුතු ය.

14. සෑම පෙර පුහුණු කැඩෙට් නිලධරයකු ම විසින්, තම පුහුණුව ආරම්භ කිරීමට පෙර, නියමිත දිවුරුම දී, අත්සන් කිරීම හෝ නියමිත ප්‍රතිඥාව දී, අත්සන් කිරීම හෝ කළ යුතු ය. දිවුරුම හෝ ප්‍රතිඥාව.

## II වන කොටස

### සාමාන්‍ය කරුණු

15. (1) නියම කළ යුතු යයි මේ පනතින් අවශ්‍ය කරන සියලු කරුණු සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට මේ පනතින් බලය දෙන ලද සියලු කරුණු සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය. නියෝග.

(2) (1) වන උපවගන්තියෙන් පවරා තිබෙන බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඒ අතුරින් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැකි ය:—

(අ) අභ්‍යාස ආයතනයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) අභ්‍යාස ආයතනයට පෙර පුහුණු කැඩෙට් නිලධරයන් බඳවා ගැනීම පිළිබඳ කාර්ය පටිපාටිය;

(ඇ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන්ගේ සේවා නියමයන් සහ කොන්දේසි සහ ඔවුන් පුහුණුව ලබන කාලය තුළ ඔවුන්ට ගෙවනු ලබන දීමනා;

(ඈ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන්ගේ හැසිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය;

(ඉ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන් සඳහා නේවාසික පහසුකම් සහ සලාක සැලසීම ; සහ

(ඊ) අභ්‍යාස ආයතනයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම පිළිබඳ කාර්ය පටිපාටි.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර, එසේ පළ කරනු ලබන දින යෙහි සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලබන යම් පසු දිනයක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් පරිච්ඡින්න වූ දිනය ලෙස සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීමක් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අභ්‍යාස ආයතනයේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**16.** අභ්‍යාස ආයතනයේ සියලුම සාමාජිකයන්, නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අභ්‍යාස ආයතනය අල් ලෙස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**17.** අභ්‍යාස ආයතනය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

මේ පනත යටතේ හෝ අභ්‍යාස ආයතනයේ විධානය පිට හෝ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව.

**18.** (1) (අ) අභ්‍යාස ආයතනය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සඳහා අභ්‍යාස ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ අභ්‍යාස ආයතනයේ විධානය පිට හෝ අභ්‍යාස ආයතනයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ නියෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සඳහා ඔහුට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) අභ්‍යාස ආයතනය විසින් හෝ අභ්‍යාස ආයතනයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අභ්‍යාස ආයතනය විසින් දරන ලද යම් වියදමක් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අභ්‍යාස ආයතනයට ගෙවූ හෝ අභ්‍යාස ආයතනය විසින් ලබා ගන්නා ලද හෝ නඩු ගාස්තු අභ්‍යාස ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ අභ්‍යාස ආයතනයේ විධානය පිට හෝ කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කළ හොත්, ඒ වියදම ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඔහු විසින් ආපසු ලබා ගනු ලැබුවහොත් මිස, අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

19. සේනාවිධායක විසින්, මණ්ඩලයේ අනුමතය ඇතිව, පහත සඳහන් සියලුම කරුණු සම්බන්ධයෙන් හෝ ඉන් යම් කරුණක් සම්බන්ධයෙන් හෝ රීති සාදනු ලැබිය හැකි ය :— රීති සෑදීමට සේනාවිධායකට ඇති බලය.

(අ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන් සඳහා අභ්‍යාස ආයතනය විසින් සැලසිය යුතු අධ්‍යයන පාඨමාලා ;

(ආ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන් සඳහා අභ්‍යාස ආයතනය විසින් සැලසිය යුතු සේවා පුහුණුව ;

(ඇ) පෙර පුහුණු කැඩෙට් නිලධරයන් සඳහා අභ්‍යාස ආයතනය විසින් සැලසිය යුතු වෛද්‍ය, සුභසාධක සහ විනෝද පහසුකම් ; සහ

(ඈ) අභ්‍යාස ආයතනයේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව සඳහා අවශ්‍ය පියවර.

## III වන කොටස

## චංචල සහ නිශ්චල දේපළ සතු කිරීම

20. (1) 1979 ජූලි මස 11 වන දින අංක 1292 දරන ඔප්පුව මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට පරිත්‍යාග කරනු ලැබූ සහ මෙහි සඳහන් උපලේඛනයෙහි විස්තර කොට ඇති, සියලු ඉඩම් සහ නිවාස ස්ථාන ද, 1980 අප්‍රේල් මස 7 වන දින අංක 1389 දරන ඔප්පුව මගින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී සතු කිරීමේ නියමය.

ජනරජයට පරිත්‍යාග කරනු ලැබූ සහ එහි සඳහන් උපලේඛනයෙහි විස්තර කොට ඇති, සියලු චංචල දේපළ ද, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) නියමයක් මගින්, එම නියමයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි (මෙහි මින් මතු "සතු කිරීමේ දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට අභ්‍යාස ආයතනය වෙත සතු කළ යුතු ය.

(2) සතු කිරීමේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, එසේ සතු කරනු ලැබූ සියලු චංචල දේපළ සමග, සියලු ඉඩම් සහ නිවාස ස්ථානයන්හි පරම අයිතිය, සියලු බැඳීම්වලින් තොරව, සතු කිරීමේ දින සිට, අභ්‍යාස ආයතනයට ලැබිය යුතු අතර, ඒ සතු කිරීම, ඒ ඉඩම්වලට සහ නිවාස ස්ථානවලට හෝ ඒවා කෙරෙහි කවර හෝ අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ හෝ ඇති බවට හිමිකම් පාන්නා වූ සියලු තැනැත්තන්ට විරුද්ධව, සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සතු කිරීමේ නියමයක්, ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු, හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

විනිශ්චයට භාජන වී ඇති නඩු කටයුතු.

**21.** මේ පනතින් අභ්‍යාස ආයතනය වෙත සතු කරනු ලැබූ යම් නිශ්චල හෝ චංචල දේපළක් සම්බන්ධයෙන් යම් සිවිල් නඩුවක්, අභියාචනයක් හෝ වෙනත් නඩු කටයුත්තක්, එසේ සතු කිරීමේ දිනයේ දී විනිශ්චයට භාජන වී තිබුණ අවස්ථාවක, ඒ සිවිල් නඩුව, අභියාචනය හෝ වෙනත් නඩු කටයුත්ත නතර නොවිය යුතු අතර, ඒ අනුව අභ්‍යාස ආයතනය විසින් හෝ අභ්‍යාස ආයතනයට විරුද්ධව හෝ එය පවත්වාගෙන යා යුතු ය.

යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ අයිතිවාසිකම් සහ බැඳීම්.

**22.** 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සතු කිරීමේ නියමයක් කරනු ලැබූ අවස්ථාවක, එසේ සතු කරනු ලැබූ ඉඩම් සහ නිවාස ස්ථාන සම්බන්ධයෙන් යම් ගිවිසුමක් හෝ එකඟවීමක් යටතේ වූ සහ සතු කිරීමේ දිනයේ පවත්නා සියලු අයිතිවාසිකම් සහ බැඳීම් අභ්‍යාස ආයතනය වෙත සතු විය යුතු ය.

සතු කිරීමේ නියමයෙන් යම් ඛනිජ ද්‍රව්‍යයකට අයිතිවාසිකමක් නොපැවරෙන බව.

**23.** 20 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ සතු කිරීමේ නියමයක් මගින් සතු කරනු ලැබූ යම් ඉඩමක, ඉඩමක් තුළ හෝ ඒ මතු පිට ඇති යම් ඛනිජ ද්‍රව්‍යයක් කෙරෙහි ඇති අයිතිවාසිකමක් ඒ නියමයෙන් පැවරෙන ලෙස නොසැලකිය යුතු අතර, ඒ සෑම ඛනිජ ද්‍රව්‍යයක්ම ජනරජයේ පරම දේපළක් ලෙස පවතින ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේම පැවතිය යුතු ය.

**24.** 1979 ජූලි මස 11 වන දින අංක 1292 දරන ඔප්පුවෙහි සහ 1980 අප්‍රේල් මස 7 වන දින අංක 1389 දරන ඔප්පුවෙහි "කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය, කොතලාවල පුර" යන්නට කෙරෙන යම් සඳහනක්, මේ පනත යටතේ පිහිටුවනු ලැබූ "ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය, කොතලාවල පුර" යන්නට කෙරෙන සඳහනක් වශයෙන් සැලකිය යුතු ය.

"කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය කොතලාවල පුර" යන්නට කෙරෙන සඳහනක් "ශ්‍රීමත් ජෝන් කොතලාවල රාජ්‍ය ආරක්ෂක අභ්‍යාස ආයතනය කොතලාවල පුර" යන්නට කෙරෙන සඳහනක් වශයෙන් සැලකිය යුතු බව.

**25.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

අර්ථ නිරූපණය.

"ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා යුද්ධ හමුදාව; හෝ

(ආ) ශ්‍රී ලංකා නාවික හමුදාව; හෝ

(ඇ) ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අදහස් වේ.

## උපලේඛනය

1. බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද, 1956 අගෝස්තු මස 23 වන දින අංක 955 දරන පිඹුර මගින්, කඳවල වත්ත නමැති ඉඩමෙන් බෙදා වෙන් කොට ඒ සැලැස්මේ ලොට් අංක 12 වශයෙන් පෙන්නුම් කර ඇති ඉඩම් කොටසින් නැවත බෙදා වෙන් කළ (ජලාශයක් වූ) ලොට් "ඒ" දරන බිම් කොටස, එනම් බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද, 1978 දෙසැම්බර් 21 වන දින අංක 2339 දරන පිඹුරට අනුකූලව, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළේ, පල්ලෙ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, දකුණු රත්මලානේ පිහිටි උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට පාරවල්වලින් මායිම් වූ ද ප්‍රමාණයෙන් අක්කර හතකුත් රූඩ් දෙකකුත් පර්චස් දහතුනයි දශම හතරයි තුනකින් (අක්. 7, රූඩ් 2, පර්. 13.43) සමන්විත වූ ද ඉඩම් කොටස, එකී අංක 2339 දරන පිඹුරේ සඳහන් මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ.

2. බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද, 1956 අගෝස්තු 23 දින අංක 955 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 12 දරන ඉඩම් කොටසින් බෙදා වෙන් කළ ඉඩම් කොටසක් වන්නා වූ ද බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද, 1978 දෙසැම්බර් 21 වන දින අංක 2339 දරන පිඹුරේ ලොට් "බී" වශයෙන් පෙන්නුම් කර ඇත්තා වූ ද ඉහත කී පල්ලෙ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ, දකුණු රත්මලානේ පිහිටියා වූ ද උතුරට කඳවල වත්තේ කොටසකින් සහ රජයේ ඉඩම්වලින් ද නැගෙනහිරට පාරෙන් සහ ලොට් "සී" දරන බිම් කොටසින් ද දකුණට ලොට් "ඩී" දරන බිම් කොටසින් සහ කඳවල වත්තේ කොටසකින් ද බස්නාහිරට පාරෙන් සහ කඳවල වත්තේ කොටසකින් ද මායිම් වූ ද ප්‍රමාණයෙන් අක්කර නවයකුත් රූඩ් එකකුත් පර්චස් විසිහතරකින් (අක්. 9, රූඩ් 1, පර්. 24) යුක්ත වූ ද ඉඩම් කොටස, එකී අංක 2339 දරන පිඹුරේ සඳහන් මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ.

3. බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද 1956 අගෝස්තු 23 වන දින අංක 955 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 12 දරන ඉඩම් කොටසින් බෙදා වෙන් කළ ඉඩම් කොටසක් වන්නා වූ ද බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද, 1978 දෙසැම්බර් 21 වන දින අංක 2339 දරන පිඹුරේ ලොට් "සී" වශයෙන් පෙන්නුම් කර ඇත්තා වූ ද ඉහත කී පල්ලෙ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දකුණු රත්මලානේ පිහිටියා වූ ද උතුරට ලොට් "බී" දරන ඉඩම් කොටසින් ද නැගෙනහිරට පාරෙන් ද දකුණට ලොට් "ඩී" දරන ඉඩම් කොටසින් හා බස්නාහිරට ලොට් "බී" දරන ඉඩම් කොටසින් ද මායිම් වූ ද ප්‍රමාණයෙන් රූඩ් තුනකුත් පර්චස් තිස්තුනයි දශම එකයි දෙකකින් (අක්. 0, රූඩ් 3, පර්. 33.12) සමන්විත වූ ද ඉඩම් කොටස, එකී අංක 2339 දරන පිඹුරේ සඳහන් මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ.

4. බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද, 1956 අගෝස්තු 23 වන දින අංක 955 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 12 දරන ඉඩම් කොටසින් බෙදා වෙන් කළ ඉඩම් කොටසක් වන්නාවූ ද බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද, 1978 දෙසැම්බර් 21 වන දින අංක 2339 දරන පිඹුරේ ලොට් "ඩී" වශයෙන් පෙන්නුම් කර ඇත්තා වූ ද ඉහත කී පල්ලෙ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දකුණු රත්මලානේ පිහිටියා වූ ද එකී සැලැස්මට අදාළ උතුරට ලොට් "බී", "සී" සහ "ඊ" දරන බිම් කොටස්වලින් ද නැගෙනහිරට ලොට් "එෆ්" දරන බිම් කොටසින් හා කඳවල වත්තේ කොටස කින් ද දකුණට පාරෙන් සහ බස්නාහිරට ලොට් "බී" දරන කොටසින් ද මායිම් වූ ද ප්‍රමාණයෙන් අක්කර දහහතකුත් රූඩ් දෙකකුත් පර්චස් දශම අටයි නවයකින් (අක්. 17, රූඩ් 2, පර්. 0.89) යුක්ත වූ ද ඉඩම් කොටස, එහි පිහිටි ගොඩනැගිලි සහ එකී 2339 දරන පිඹුරේ සඳහන් මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ.

5. බලයලත් මිනින්දෝරු එස්. රාජේන්ද්‍ර විසින් සාදන ලද, 1956 අගෝස්තු 23 වන දින අංක 955 දරන පිඹුරේ පෙන්නුම් කර ඇති ලොට් අංක 12 දරන ඉඩම් කොටසින් බෙදා වෙන් කළ ඉඩම් කොටසක් වන්නා වූ ද බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාදන් විසින් සාදන ලද, 1978 දෙසැම්බර් 21 වන දින අංක 2339 දරන පිඹුරේ ලොට් "ඊ" වශයෙන් පෙන්නුම් කර ඇත්තා වූ ද ඉහත කී පල්ලෙ පත්තුවේ දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දකුණු රත්මලානේ පිහිටියා වූ ද එකී සැලැස්මට අනුකූලව උතුරට ගුවන් තොටුපළ පැරෙත් සහ රජයේ ඉඩම්වලින් ද නැගෙනහිරට පාරෙන් ද දකුණට ලොට් "ඩී" සහ "එෆ්" දරන ඉඩම් කොටස්වලින් සහ බස්නාහිරට රජයේ ඉඩම්වලින් සහ පාරෙන් ද මායිම් වූ ද ප්‍රමාණයෙන් අක්කර අටකුත් රූඩ් දෙකකුත් පර්චස් දහහතකුත් දශම එකයි දෙකකින් (අක්. 8, රූඩ් 2, පර්. 17.12) යුක්ත වූ ද ඉඩම් කොටස, එකී අංක 2339 දරන පිඹුරේ සඳහන් මාර්ග පාවිච්චි කිරීමේ අයිතිය ද සමඟ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 60 කි. (විදේශීය) රු. 80 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.